# ශ්‍රී ලංකා විදුලි සංදේශ නිායමන කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## රියදුරු තනතුර සඳහා බඳවා ගැනීම ( බාහිර)

- වාහන හොඳ තත්ත්වයෙන් ආරක්ෂිතව තබා ගැනීම සහ නිසි ආකාරයෙන් නඩත්තු කිරීම.
- වාහන සඳහා භාවිතා කරන සියලුම ලිහිසි තෙල් සහ අමතර ද්‍රව වර්ග නිතිපතා සේදීම, පිරිසිදු කිරීම සහ පරීක්ෂා කිරීම.
- වාහනවල ආරක්ෂාව සඳහා වගකිව යුතු වීම.

- **අවශ්‍ය අවම අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද:**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව ඇතුළුව, අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

**සහ**

තාර බර හොණ්ඩර 24 ට අඩු පුද්ගලික හෝ කුලී මෝටර් රථ සහ ස්ටේෂන් වැගන් රථ ධාවනය සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබීම . ( බඳවා ගැනීමේ දිනයට පෙර අවම වශයෙන් වසර 03කට පෙර C හා C1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව B පන්තියේ රියදුරු බලපත්‍රයක් ලබාගෙන තිබිය යුතුය.)

**සහ**

මහාමාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු වීම .

**සහ**

මෝටර් රථ රියදුරෙකු ලෙස වසර 3 ක සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතු වීම. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය)

- **බඳවා ගැනීමේ පටිපාටිය**

ප්‍රායෝගික පරීක්ෂණයේ සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතා ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

- **වැටුප :-** TRC 10.1 -Rs. 78,826 (10x994) -(10x1408)-(10x2112)-(10x2816) – 152,126
- **වයස** : අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-45 විය යුතුය.
- **අයදුම් කිරීමේ ක්‍රමය:**
  1. අයදුම්පත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.trc.gov.lk. වෙතින් බාගත කරගත හැකිය.
  2. නියමිත ආකෘතිය අනුව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
  3. අයදුම්පත් පැහැදිලි සහ කියවිය හැකි විය යුතු අතර, අවශ්‍යතා නොසපුරන අයදුම්පත් සලකා බලනු නොලැබේ.
  4. සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතිකවල පිටපත් සහ සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර සමඟ එවිය යුතුය.
  5. සියලුම අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් සහිතව **2026.06.01 දින හෝ එදිනට පෙර "අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ රියදුරු තනතුරට බඳවා ගැනීම (බාහිර)** යනුවෙන් සඳහන් කළ යුතුය.
  6. අයදුම්පතෙහි ස්කෑන් කරන ලද පිටපතක් අදාළ අධ්‍යාපනික සහ වෘත්තීය සහතික සමඟ careers@trc.gov.lk විද්‍යුත් තැපෑලට එවිය යුතුය. විද්‍යුත් තැපෑලෙහි මාතෘකාව **" රියදුරු තනතුරට බඳවා ගැනීම (බාහිර) - 2026"** විය යුතුය.
  7. රාජ්‍ය ආයතනවල සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
  8. අයදුම්පත් 2026.06.01 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය.

**(7) පොදු කොන්දේසි**

1. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
2. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සලකා බලනු නොලැබේ.
3. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
4. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
5. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) නියාමන අධිකාරියක් වන අතර , කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ඕනෑම තැනැත්තකු විසින් ඔහුගේ / ඇයගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයකු කොමිෂන් සභාවේ නියාමන පාලනයට යටත් වන ආයතනයක තනතුරකට පත් කිරීම හෝ රැකියාවක නිරත වීම උදෙසා සෘජුව හෝ වක්‍රව අනුබල දීම / දිරි ගැන්වීම / උපදෙස් දීම සිදු නොකළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**අංක .276**
**ඇල්විටිගල මාවත**
**කොළඹ 08**

**රියදුරු තනතුර සඳහා අයදුම්පත්‍රය (බාහිර )**

1. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන් ) :මහතා ./ මහත්මිය ./ මෙනවිය ………………………………………………

2. සම්පූර්ණ නම ( ඉංග්‍රීසියෙන් ) : ………………………………………………………………………

3. සම්පූර්ණ නම ( සිංහලෙන් / දෙමළින්) :…………………………………………………………………..

4. ලිපිනය : ………………………………………………………………………

5. උපන් දිනය :…………………….. 2026 . 05.25 දිනට වයස : ………………………….

6. දුරකථන අංකය .: ………………………

7. විද්‍යුත් තැපැල් ලිපිනය ……………………………………..

8. ජාතික හැඳුනුම්පත් අංකය : ……………………………………………..

9. ස්ත්‍රී/ පුරුෂ භාවය : ……………………………………………

10. අධ්‍යාපන සුදුසුකම් : ……………………………………………………………………

11.වෘත්තීය සුදුසුකම් : ………………………………………………………………

12.සේවා පළපුරුද්ද ………………………………………………………………………

13. ඔබ රජයේ සේවයේ නියුක්ත නම්:

ආයතනය : ……………………………………………………….

තනතුර : ………………………………………………………..

14. අමුණා ඇති සහතික පිටපත්

1 ………………………………………………………………………

2.………………………………………………………………………

3.………………………………………………………………………

4.………………………………………………………………………

15. අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය සහ නිවැරදි බව මම ගෞරවයෙන් ප්‍රකාශ කරමි. මෙම අයදුම්පතේ කිසියම් තොරතුරක් අසම්පූර්ණව හෝ වැරදි ලෙස ඉදිරිපත් කිරීමෙන් ඇතිවිය හැකි ඕනෑම ප්‍රතිඵලයක් සඳහා වගකීම භාර ගැනීමට මම එකඟ වෙමි. තවද, මෙම අයදුම්පතෙහි සඳහන් සියලු කරුණු මාගේ දැනුම අනුව නිවැරදි බවද මම සහතික කරමි.

දිනය : ……………………… අයදුම්කරුගේ අත්සන : ……………………………………..

16. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය (රජයේ ආයතනවල සේවය කරන අයදුම්කරුවන් සඳහා)

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන …………………………………………………………… මහතා/මහත්මිය/මෙනවිය …………………………………………. තනතුරේ සේවය කරමින් සිටින අතර, ඔහුගේ/ඇයගේ සේවය සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහු/ඇයට එරෙහිව කිසිදු විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්, අනාගතයේදී එවැනි ක්‍රියාමාර්ගක් ගනු ලබන බවට තීරණය කර නොමැති බවත් මම මෙයින් සහතික කරමි. තවද, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය මෙම ආයතනයේ සේවයෙන් මුදාහැරිය හැකි / නොහැකි බව මෙයින් දැනුම් දෙමි.

දිනය : ……………………… ආයතන ප්‍රධානීගේ අත්සන : ……………………………………..

නම : ..............................................................................................................................................

තනතුර : - ....................................................................................................................................

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව /ආයතනය : -…………………………………………………………………

නිල මුද්‍රාව :